# 09

# ශ්‍රී ලංකා ගුවන්විදුලියේ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය සඳහා නව-අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ක්‍රමවේදය (IMC) හඳුන්වාදීම


සේන නානායක්කාර [1]



## Abstract

***The Radio Broadcasting is a useful medium that could be utilized in the field of Development Communication. It has become extremely popular due to its simplicity and the use of spoken language as its career. The sound plays a wonderful and leading role in its capacity of expanding imagination. These specialties contribute much in making Development Communication a vibrant tool in radio broadcasting. When past evaluations are taken into consideration in respect of Sri Lankan Broadcasting it has been a continuous failure. Therefore, analyzing the relationship between the evaluations in the past and the modern context it would be appropriate to introduce a Neo-development Communication Strategy concentrating 'Institute, Media and Community' (IMC) which would be the main objective of the present study. An attempt would be made to study the agricultural and educational programs to produce an appropriate evaluation process and a policy based mobilization. The solution suggested is to be processed through a participatory system of two way communication i.e. building relationship between radio and the community. The inter-relationship among the Institute, Media and Community would be a powerful force in Development Communication. The message expected to be conveyed by way of IMC extremely useful in formulating a new strategy for implementation of any project on the Development Communication.***



***Key words- development communication, expansion of imagination, continuous interrelation format***


## හැඳින්වීම

සමාජ, ආර්ථීක, හා සංස්කෘතික යනාදි සකලවිධ ක්ෂේත්‍රයන්හි දැක්වෙන යහපත්


[1] *ආචාර්ය සේන නානායක්කාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,* senananayakkara@gmail.com/sena@ssh.rjt.ac.lk

වෘද්ධිමය ස්වභාවය සංවර්ධනය ලෙස හඳුන්වා දිය හැකි ය.

ඒ සඳහා ඍජු ලෙස පිටුබල සැපයෙන සන්නිවේදන ක්‍රියාවලිය සංවර්ධනාත්මක සන්නිවේදනය ලෙස අර්ථකථනය කෙරේ. විද්‍යුත්, මුද්‍රිත හා ඉන් පරිබාහිර සියලු සන්නිවේදන ක්‍රියාවලීන් කෙරෙහි මෙය අදාළ වෙයි. ඕනෑම සමාජ ක්ෂේත්‍රයක් හෝ ඕනෑම විෂය ප්‍රපංචයක් ඊට වලංගු ය. එබැවින් ගුවන්විදුලිය මාධ්‍ය හා සමාජ සංවර්ධනය ඒ හා ඍජු ලෙසම බැඳී පවතින්නක් ලෙස අවධාරණය වෙයි. ඒ අනුව, මෙතෙක් කලක් ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යයත්, එහි සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලියත් ගැඹුරු විශ්ලේෂණයකට යටත්කොට, පුළුල් පර්යේෂණාත්මක අධ්‍යයනයක් තුළින් නව ක්‍රමවේදයක් යෝජනා කිරීම මෙමගින් සිදුකෙරේ. ආයතනය (Institute), මාධ්‍ය (Media) හා ප්‍රජාව (Community) යන පාර්ශවත්‍රය මුල්කොටගත් අඛණ්ඩ අන්තර් සම්බන්ධතාව (IMC) මෙහි ප්‍රමුඛ කොට ගැනේ. ලාංකේය ගුවන්විදුලිය මාධ්‍ය හා බැඳුණු දශක නවයකට ආසන්න කාලයක් තුළ විද්‍යාත්මක වශයෙන් ප්‍රථමවරට සිදුකෙරෙන හඳුන්වාදීමක් වන බැවින් මෙය, **'නව-අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ක්‍රමවේදය'** ලෙස නම් කෙරේ. අදාළ පාර්ශවයන් අතර පවත්වාගත හැකි දැඩි සම්බන්ධතාව, ප්‍රතිචාර පිරික්සුම් සහිත නිවැරදි පසුවිමසුම් කාර්යය හා නිරවද්‍ය ඇගයුම් සහිත ප්‍රතිපෝෂණීය ස්වරූපය මෙමඟින් කුළුගැන්වෙයි.

සංවර්ධනාත්මක සන්නිවේදනය වූ කලී අතිශය පුළුල් මාධ්‍ය ක්‍රියාදාමය කි. එය සාමාන්‍ය සන්නිවේදනයෙන් වෙනස් වනුයේ සංවර්ධනාත්මක සන්නිවේදනයෙහි ලා ප්‍රකට කෙරෙන සුවිශේෂතා රාශියක් හේතුවෙනි. සමාජ කාර්යභාරයක් ලෙස ඊට අදාළ කරගත යුතු පාර්ශවයන් බොහෝ ය. මානවයා හා බැඳුණු සකලවිධ පාරිසරික ස්වභාවයන් ඊට අදාළ වෙයි. සංවර්ධනය වූ කලී එකී සියලු පාර්ශවයන් හි ප්‍රකට කෙරෙන යහපත් වෘද්ධිය යි.

එසේ නම්, පූර්වෝක්ත ක්‍රියාවලිය උදෙසා පුද්ගලයා පමණක් නොව, මුළු මහත් සමාජය ත්, ඒ හාත්පස වන සමස්ත පරිසරය ත් එකිනෙකට ඈඳී තිබිය යුතු ය. "සමාජය වූ කලී අන්තර් සම්බන්ධතා ජාලය කි." යන ප්‍රකට ප්‍රකාශය තුළ කුළු ගැන්වෙනුයේ ද එබඳු ම අදහස කි. ඒ අනුව, මුළු මහත් සමාජය ම එකිනෙකට සම්බන්ධ වියයුතු යැයි හැඟෙන පුළුල් සන්නිවේදන ක්‍රියාදාමයකදී හුදෙක් එක් සන්නිවේදන මාධ්‍යයක් හා ප්‍රජාව අතර පමණක් තාවකාලික ව කෙරෙන පණිවිඩ හුවමාරුව ප්‍රමාණවත් නොවනු ඇත.

ඒ අනුව, යම් සංවර්ධන ව්‍යාපෘතියක් හෝ වෙනත් සමාජ සුබසාධනමය පොදු ක්‍රියාමාර්ගයක් පුළුල් ලෙස සමාජ ගතකිරීමේදී අත්‍යවශ්‍යයෙන් තිබිය යුතු ස්ථාවර වූ ත්, අඛණ්ඩ වූ ත් ජාලාකාර සම්බන්ධතාව ඉතා වැදගත් වෙයි.

එසේ නොමැති වූ විට සිදුවන්නේ උක්ත ව්‍යාපෘතිය හෝ සුබසාධනමය ක්‍රියාමාර්ගය ප්‍රජාවගෙන් ඈත් වූ හුදෙකලා මාධ්‍ය ක්‍රියාකාරකමක් පමණක් වීම ය. ශ්‍රව්‍යගෝචර මාධ්‍යයක් වූ ගුවන්විදුලියට මෙය සුවිශේෂයෙන් අදාළ කොටගත හැකි ය. එනම්, ගුවන්විදුලිය ත්, පුද්ගල සමාජය හා ආයතනයත් අතර නිර්මාණය කෙරෙන බැඳීම තුළින් එය ඵලදායක සන්නිවේදන ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීම යි. නව - අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ක්‍රමවේදය (IMC – New-Interrelation Format) යෝජනා කෙරෙනුයේ එබැවිනි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී අපගේ විමර්ශනාක්ෂිය යොමු කෙරෙනුයේ ශ්‍රී ලාංකේය ගුවන්විදුලිය මාධ්‍යයේ අතීත ක්‍රියාකාරකම් කෙරෙහි ය. 1924 වර්ෂයේ සිට ගතවූ පුරා දශක නවයකට ආසන්න කාලයක් ඊට විෂය වෙයි. එකී කාල පරාසයක් තුළ ඊට අදාළව ගොඩනැගුණු සාහිත්‍යය පරිශීලනය මෙහි ප්‍රමුඛතම පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගැනේ. ඒ හැර අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහඉලුප්පල්ලම ග්‍රාමයේ තෝරාගත් කෘෂිකාර්මික නියැදියක සිදුකෙරුණු ප්‍රායෝගික වැඩමුළු හා ඊට අදාළ සහභාගීත්ව නිරීක්ෂණයන් ද මේ සඳහා පාදක කොට ගැනිණි. ඒ අනුව, පහත සඳහන් දත්ත පිරික්සුම් ක්‍රියාවලීන් මෙකී අධ්‍යයනය සඳහා උපයෝගි කොට ගැනිණි.

- මුද්‍රිත හා ලිඛිත සටහන් පරිශීලනය
- තැටි, පටි ආශ්‍රිත ගුවන්විදුලිය වැඩසටහන් ශ්‍රවණය
- සම්මුඛ සාකච්ඡා (ආයතනික) හා
- ප්‍රායෝගික කෘෂිකාර්මික කටයුතුවලට අදාළ සහභාගීත්ව නිරීක්ෂණයන්

## සාකච්ඡාව හා ප්‍රතිඵල

සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාදාමයේ දී ලාංකීය ගුවන්විදුලි ඉතිහාසය පුරා මේ සම්බන්ධයෙන් ලබාගත හැකි නිදසුන් අපමණ ය. ඒවා එකිනෙක පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීමට ප්‍රයත්න දැරීම, අනවශ්‍ය ලෙස කාලය කා දැමීමක් විය හැකි බවට යම් කෙනෙකුට සිතිය හැකි ය. නමුත්, ඒ හා අදාළ සිද්ධිමය අවස්ථා සම්බන්ධයක් ඉතිහාසයෙන් උපුටා දැක්වීම ඵලදායක විග්‍රහයක් සඳහා අත්‍යවශ්‍ය සාධකයක් කොට සැලකිය හැකි ය.

සංවර්ධනාත්මක සන්නිවේදන කාර්යාවලිය යටතට ගැනුණු ශ්‍රී ලාංකීය ගුවන්විදුලියේ ක්‍රියාකාරකම් අපමණ ය. ඒවා මූලික වශයෙන් කොටස් කිහිපයක් ලෙස වර්ගීකරණයකට ලක් කළ හැකි ය. ඒවා මෙසේ ය.

| වැඩසටහන් වර්ගය | | | පුළුල් අරමුණක් ලෙස |
|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික සංවර්ධනය | - | ආර්ථිකමය වර්ධනය |
| 2. | කර්මාන්ත හා වෙනත් | - | ආර්ථිකමය හා වෘත්තීමය |
| 3. | අධ්‍යාපනික සංවර්ධනය | - | දැනුම හා අනාගත අපේක්ෂා සාධනය |
| 4. | ආගමික සංවර්ධනය | - | සදාචාරාත්මක හැදියාව |
| 5. | සංස්කෘතිකමය සංවර්ධනය | - | ජාතික උරුමයන් පිළිබඳ හැඟීම |
| 6. | ප්‍රවෘත්තිමය සංවර්ධනය | - | කාලීන අවබෝධය තහවුරු කිරීම |
| 7. | පාරිසරික සංවර්ධනය | - | පොදු සම්පත් ආරක්ෂණය |
| 8. | ක්‍රීඩා හා වෙනත් | - | ශාරීරික සෞඛ්‍ය/ජීවන කුසලතා වර්ධනය |
| 9. | යෞවන/තරුණ සංවර්ධනය | - | පෞරුෂත්ව වර්ධනය/නායකත්වය පුහුණුව |
| 10. | කාන්තා හා ළමා සංවර්ධනය | - | ජීවන කුසලතා හා පුද්ගල සංවර්ධනය |
| 11. | සංගීත හා නාට්‍යමය | - | රුචිය, රසවින්දනය හා සංවේදී බව |
| 12. | වෙනත් සංවිධානමය | - | පොදු ජන සුබසාධනය |
| 13. | විවේචන හා විමර්ශන | - | විචාර පූර්වක නිදහස් චින්තනය |
| 14. | විචිත්‍රාංගමය හා විනෝදාත්මක | - | පොදුජන මානසික සන්තර්පණය |

ඉහත දක්වෙන්නේ කිසිදු විධිමත්භාවකින් තොර ව කරන ලද වර්ගීකරණයක් වුව ද ඒ සඳහා සපුරා අදාළ වන නිදසුන් ලාංකික ගුවන්විදුලියේ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය තුළ විරල නොවේ. වැඩසටහන් වර්ගය සහ ඉන් අපේක්ෂිත ඉලක්ක ද ඊට ම සම්බන්ධ කොට තිබේ. මේ සියල්ල සමස්තයක් ලෙස ගත් කල සංවර්ධනමය තේමාව හරහා පෙළ ගැස්වීමට අපහසු නොවේ. මන්දයත්, පුළුල් සංවර්ධන ක්‍රියාවලියෙහි ලා අදාළ නො වන පාර්ශවයක් සොයා ගැනීම දුෂ්කර බැවිනි. ඒ හැර, මෙකී වැඩසටහන් වර්ගීකරණය තවදුරට ත් ඉතා සියුම් ව සිදුකිරීමේ හැකියාව ඇත. කෙසේ වුව ද, සියල්ල අයත් වන්නේ පූර්වෝක්ත සංවර්ධන තේමාවට වෙයි. එබැවින්, ගුවන්විදුලියෙන් විකාශය කෙරෙන සකලවිධ වැඩසටහන් එහි සංවර්ධනාත්මක කාර්යභාරයට අයත් යැයි උපකල්පනය කිරීම සාවද්‍ය නොවේ.

දැන් අපි එහි විවාදාත්මක කාරණාවට පිවිසෙමු. උක්ත වැඩසටහන් අතරින් ඍජු ලෙස ම සංවර්ධනාත්මක සන්නිවේදනයෙහි ලා ගැනෙන වැඩසටහනක් ගනිමු.

එබඳු වැඩසටහන් ප්‍රචාරයක් හා සම්බන්ධයෙන් සලකා බලන කල ගුවන්විදුලිය ත්, එකී වැඩසටහනට අදාළ ආයතනය හෝ ආයතන කිහිපය ත් අතර ගොඩනැගෙන සම්බන්ධතාව කෙබඳු ද? ලාංකීය ගුවන්විදුලි ඉතිහාසය තුළ එ ලෙස ගොඩනගාගත් ආයතනික සම්බන්ධතා අද වන විට කොතෙක් අඛණ්ඩ ව ශේෂ ව පවතින්නේ ද?

මෙකී ගැටලුව ප්‍රධාන රාජ්‍ය ගුවන්විදුලියට පමණක් සීමාවන්නක් නොවේ. ප්‍රාදේශීය ගුවන්විදුලියට හෝ ප්‍රජා ගුවන්විදුලියට හෝ සෙසු පෞද්ගලික නාලිකාවනට ද පොදු වන්න කි. නමුත්, අප ප්‍රස්තුතය වනුයේ රාජ්‍ය ගුවන්විදුලිය වන බැවින් ඒ කෙරෙහි මෙහි දී අපගේ සුවිශේෂ අවධානය යොමු වන බව සැලකිය යුතු ය.

කෘෂිකර්මාන්ත සංවර්ධනය හා ලාංකීය ගුවන්විදුලිය පිළිබඳ නිදසුනක් ගනිමු. සමස්ත සංවර්ධන ක්‍රියාදාමයෙහි වැඩි අවධානයක් හා සුවිශේෂ කැපකිරීමක් කෘෂිකර්මාන්තය කෙරෙහි යොමු කිරීම ශ්‍රී ලංකාව තුළ අප ලබා ඇති අත්දැකීම යි. රට සංවර්ධන මාර්ගයට ශීඝ්‍රයෙන් යොමු කිරීමේ සුවිශාල ව්‍යාපෘති රාශියක් දියත් කෙරෙනු අප දැක ඇත. එය ඉතිහාසයේ පටන් අද දක්වා දිගු කලක් තිස්සේ කෙරෙමින් පවතින්නකි. ගුවන්විදුලිය හා කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මුල් වකවානුව තුළ වඩා ත් කැපී පෙනුණු යුගය 1965 -1970 අතර කාලපරිච්ඡේදය යි. කිනම් දේශපාලන පක්ෂයක් බලයේ සිටිය ද එතෙක් දුර ආ ඉතිහාසයේ කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි වැඩි ම අවධානය යොමු කරන ලද්දේ එම යුගය තුළ බව පෙනේ. ගුවන්විදුලිය මාධ්‍යය ද ඊට ම අනුගත වූ බවට සාක්ෂි අපමණ ය.

ග්‍රාමීය සංවර්ධන අවශ්‍යතා පිළිබඳ ප්‍රාදේශීය පරිපාලන පළපුරුදුකම් සහිත දක්ෂ සිවිල් නිලධාරියකු වූ නෙවිල් ජයවීර මහතා එවකට ගුවන්විදුලියේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් ව සිටි අතර එවක ගුවන්විදුලිය මාධ්‍යයේ ප්‍රධානතම ඉලක්කය වී තිබුණේ "කෘෂිකාර්මික සංවර්ධනය තුළින් ගොඩනැගෙන ස්වයංපෝෂිත රටක් " (ජයවීර, 1967) බව පෙනේ. ඒ නිසා ම එහි ගාමක බලවේගය ලෙස ක්‍රියා කළේ රාජ්‍ය ගුවන්විදුලිය යි. ආහාර නිෂ්පාදනය වැඩි කොට, ගැමි ගොවි ජනයාගේ ආර්ථික සමෘද්ධිය ළඟාකරවීමේ ඉහළ ම කාර්යභාරය සාක්ෂාත් කරවීමේ වගකීම බාරගත්තේ ගුවන්විදුලිය යි. සෑම වැඩසටහනක් ම කිසියම් වූ සංවර්ධනමය පණිවිඩයකින් සමන්විත විය. ගීතයක්, කවියක් හෝ නාට්‍යයක් වුව ද සංවර්ධන තේමාව අනුව සැකසිණි.

ගොවිජන සංග්‍රහය, ගොවි පෙරමුණ, ගොවි ජයහඬ, දක්ෂ ගොවියා, ජාතික උදාව, ජාතික ප්‍රබෝධය, තරුණ ගොවි සමාජ තරගය ආදී වැඩසටහන් රැසක් (ගුවන්විදුලි සඟරා, 1967-1969) දිගින් දිගට ම ප්‍රචාරය වන්නට විය. එවකට වඩා ත් ජනප්‍රිය ව තිබූ "ග්‍රාමීය සේවය" මගින් දිවයින පුරා අසන්නන්ගේ සමාජ 400 ක් (කරුණානායක, 1990) හා අලුතින් ආරම්භ කරන ලද තරුණ ගොවි සමාජ 300 ක් පමණ විය. ඒ සියල්ලෙන් කෙරුනේ උක්ත සංවර්ධනමය කාර්යභාරය උදෙසා අදාළ ආර්ථිකමය හා ප්‍රජා කටයුතු සංවර්ධනයෙහි ලා

අවශ්‍ය කතිකාවත් ගුවන්විදුලිය මාධ්‍ය කොටගෙන දියත් කිරීම යි. එවකට වඩා ත් සාර්ථක වූ එම ව්‍යාපෘතියට සිදු වූයේ කුමක් ද? ගැටලුව එය යි.

ගුවන්විදුලි මාධ්‍යය හා ප්‍රජාව පමණක් හුදෙකලා සම්බන්ධයක් පවත්වාගෙන යාම ප්‍රමාණවත් නො වන බව එයින් කියැවෙයි. තරුණ ගොවි සමාජය හා ගුවන්විදුලි මාධ්‍යය අතර ක්‍රියාත්මක විය යුතු සෙසු ආයතනමය ස්වරූපයන් රාශිය කි. නිදසුන් ලෙස, උක්ත සම්බන්ධයේ දී රාජ්‍ය මට්ටමෙන් අදාළ අමාත්‍යංශය ත්, ඊට අනුබද්ධ දෙපාර්තමේන්තු හා සෙසු ආයතනික ව්‍යුහයනුත් එහි දී සක්‍රිය විය යුතු ය. තරුණ ගොවි සමාජයක් ගුවන්විදුලි මැදිරියට ගෙන්වා හෝ නැතිව ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පටිගත කරවා ප්‍රචාරය කළ පමණින්, අපේක්ෂිත දිගුකාලීන ඉලක්ක සපිරේ ද? නැත. ඒ හා අදාළ තවත් බොහෝ කාර්යභාරයන් රාශියක් තිබේ. එකී කාර්යභාරයන් ඒ ඒ අදාළ ආයතනයන් වෙත පැවරීම ත් දිගුකාලීන වශයෙන් එය ක්‍රියාවලියක් ලෙස අඛණ්ඩ ව පවත්වා ගෙන යාම ත් අත්‍යවශ්‍ය කාර්යයක් වෙයි.

ලංකා ගුවන්විදුලියේ අධ්‍යාපන සේවාව පිළිබඳ ව නිදසුනක් ගනිමු. අධ්‍යාපනය වූ කලී රටක සංවර්ධන ක්‍රියාදාමයේ මූලික පසුබිම යි. සියල්ල ගොඩනැගෙන්නේ ඒ මත ය. එබැවින්, එහි භාරදූර තත්ත්වය නිසා ම 1931 මැයි මාසයේ දී ගුවන්විදුලිය විසින් පාසල් සේවාවක් ආරම්භ කරන ලදී (කොළඹගේ, 1980). පසුව පාසල් වැඩසටහන් එයින් ප්‍රචාරය කරන්නට විය. වසර 10 ක් ගතවීමෙන් පසු 1941 ශ්‍රීමත් කන්දයියා වෛද්‍යනාදන් කොමිසම ඉදිරියේ හෙළිවූයේ එකී ප්‍රචාරයන් අසාර්ථක බව යි. ඊට හේතුව, අපේක්ෂිත ශ්‍රාවක පිරිස් ඒ සඳහා අවම තරමින් හෝ යොමු වී නොමැති වීම යි. නිදසුන් ලෙස, නාගරික උසස් පාසල් ඒ සඳහා උනන්දු නො වූ බව ද හෙළි විය. බොහෝ පාසල් බලධාරීන්ට ගුවන්විදුලි පාසල් වැඩසටහන් ගැන අවබෝධයක් කොහෙත් ම නොතිබූ තරම් විය (කරුණානායක, 1990). ඒ තත්ත්වය දිගින් දිගට ම පැවතිණි. 1972 තමන් වෙත ඉදිරිපත් කෙරුණු තොරතුරු නිවැරදි ව

සමීක්ෂණය කොට විමසා බලා කියා සිටියේ "අධ්‍යාපන සේවය වඩා ත් ඵලදායී හා ප්‍රයෝජනවත් සේවාවක් කිරීමට ගුවන්විදුලි සංස්ථාව ත්, අධ්‍යාපන අමාත්‍යංශය ත් කිසිදු උනන්දුවක් ගෙන නොමැති බව යි. වසර හතලිහක කාලය තුළ අධ්‍යාපන සේවාවෙන් ඉටු වී ඇති මෙහෙය ඉතා අල්ප බව ද කොමිසමේ අදහස විය" (කරුණානායක, 1990).

මෙ බඳු නිදසුන් දහස් ගණනක් ලංකා ගුවන්විදුලි සන්නිවේදනයේ ඉතිහාසය විමර්ශනය කිරීමෙන් ලබාගත හැකි ය. මෙයින් හැඟෙන්නේ කිසිදු සංවර්ධන ගුවන්විදුලි වැඩසටහනක් මෙතෙක් ඵලදායි තත්ත්වයක් පෙන්නුම් නො කළ බවක් නොවේ. එ බඳු සාර්ථක වූ ත්, ඵලදායී වූ ත් වැඩසටහන් ද නැතුවා නොවේ. නමුත්, ඉන් පරිබාහිර වූ අතිබහුතරය වන්නේ යට කී ආකාරයේ

නිෂ්ඵල ප්‍රයත්නයන් ය. එහි දී සිදු ව ඇත්තේ ආයතනික වශයෙන් වගකීම් රහිත ව කිසිදු සම්බන්ධතාවකින් තොර ව, කරන්නන් වාලේ නාමික වැඩසටහන් ඉදිරිපත් කිරීම පමණි.

යම් කෘෂිකාර්මික සංවර්ධනමය වැඩසටහන් ව්‍යාපෘතියක දී කෘෂිකර්ම අමාත්‍යංශය හෝ දෙපාර්තමේන්තුව ත්, ගුවන්විදුලිය ත් අතර ගොඩනැගිය යුතු මනා සම්බන්ධතාව ඉතා වැදගත් වෙයි. අද වන විට සිදු කෙරෙනුයේ ඒ සඳහා අදාළ වන පරිදි යම් සම්බන්ධීකරණ නිලධාරියෙක් පත්කිරීමක් පමණි. වැඩසටහන් මාලාවක් නම්, එහි වැඩසටහන් දෙක තුනක් ප්‍රචාරය වීමෙන් පසු එය ගුවන්විදුලි නිෂ්පාදකයා පිට පමණක් පැවරෙන රාජකාරියක් බවට පත්වෙනු ඇත. එසේ නැත්නම්, ඒ ඒ සතියේ ප්‍රචාරය විය යුතු සංවර්ධන පණිවිඩය හෝ අදාළ අධ්‍යාපනික කාරණය පිළිබඳ ගුවන්විදුලි නිෂ්පාදකවරයාගේ අභිමතාර්ථ ක්‍රියාත්මක වනු ඇත. විධිමත් ලෙස කාලානුරූප ව ප්‍රජාව වෙත ලබාදිය යුතු නිශ්චිත පණිවිඩය පිළිබඳ හැඟීමක් හෝ දැනීමක් මෙහිදී ගුවන්විදුලි නිෂ්පාදකවරයාට නො තිබෙන්නට පුළුවන. බොහෝ විට තත්ත්වය එසේ ය. මන්දයත්, ඔහු ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදකවරයෙක් මිස කෘෂි ව්‍යාප්ති නිලධාරියෙක් හෝ අදාළ විශේෂඥයෙකු නො වන බැවිනි. එය එසේ වුවහොත් සාවද්‍ය අර්ථ කථනයක් හෝ විනාශකාරී සංකල්පයක් ප්‍රජාගත වෙන්නට මනා පසුබිමක් සැකසේ.

ප්‍රස්තුත IMC අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ක්‍රමවේදයෙන් ඉදිරිපත් කෙරෙන්නේ ඒ සඳහා වන යථාර්ථවාදී විසඳුම කි. මේ පිළිබඳ වඩා ත් සමීපතම අත්දැකීමක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රජරට ප්‍රාදේශීය සේවාව ඔස්සේ ද ලබාගනිමු.

1982 රජරට සේවාව මගින් මහඉලුප්පල්ලම ග්‍රාමයේ දී පවත්වන්නට යෙදුණු “රජරට ගොවිජන වැඩමුළුව” අති සාර්ථක විය. අපේක්ෂිත ඉලක්කය සපුරාලමින් ප්‍රකට කළ ගොවිජන සහභාගීත්වය ත්, පසුකාලීන ප්‍රතිචාරාත්මක ප්‍රතිඵලය ත් සතුටුදායක මට්ටමක පැවතිණි. මුල් බිං හීයේ සිට අස්වනු අලෙවිය දක්වා වූ ක්‍රියා පිළිවෙළ පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීම මේ මගින් සිදු කෙරිණි. වැඩමුළුවෙන් අනතුරු ව, කන්න දෙකක් ගිය තැන ගොවීන් ලබාගත් ඉහළ ම අස්වැන්න මහවැලි එච් කලාපයේ ඉතිහාසගත වාර්තාවක් විය (රාජපක්ෂ, 1981).

මීට හේතුවූයේ කුමක් ද? මාධ්‍ය ආයතනයක් ලෙස රජරට සේවාව එකී වැඩසටහන් සම්බන්ධයෙන් අනුගමනය කළ ක්‍රමවේදය යි. වැඩසටහන පැවැත්වූයේ මහඉලුප්පල්ලම ප්‍රදේශයේ ගොවිමහතුන්ට ය. එවකට මහඉලුප්පල්ලම ප්‍රදේශයේ පිහිටුවා තිබුණු සියලු ම අදාළ ආයතනවල

දායකත්වය මේ සඳහා ලබා ගැනීමට ත්, ඒ හා අන්තර් සම්බන්ධතා විධිමත් ලෙස ගොඩනගා ගැනීමට ත් රජරට සේවාව කටයුතු කර ඇත.

නිදසුන් ලෙස,

i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුරාධපුර දිසා කාර්යාලය
ii. ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ ආයතනය
iii. බීජ පර්යේෂණාගාරය හා පශ්චාද් බීජ පාලන ආයතනය
iv. බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවිපළ
v. බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවිසැල
vi. සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය
vii. වාරිමාර්ග ඉන්ජිනේරු කාර්යාලය
viii. ශ්‍රී ලංකා මහවැලි ආර්ථික ඒජන්සි කලාප කාර්යාලය
ix. ක්ෂේත්‍ර බෝග සංවර්ධන හා පර්යේෂණ ආයතනය
x. පුනරුත්ථාපන ව්‍යාපෘති ඉන්ජිනේරු කාර්යාලය

ආදිය එකී ආයතන අතරින් කිහිපයක් කි. වඩා ත් සැලසුම් සහගත ව, පුළුල් පූර්ව අපේක්ෂාවන් ඇති ව එකී කාර්ය සිදු කළේ වී නම් එම ව්‍යාපෘතිය ඊට ත් වඩා සඵල වන්නට ඉඩ තිබිණි. නමුත්, ඒ වන විට මෙ බඳු විද්‍යාත්මක ක්‍රමවේදයක් පිළිබඳ පර්යේෂණාත්මක හැදෑරීමක් සිදු කොට නො තිබිණි. වැඩමුළුව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම ඇතුළු සෙසු සියලු සංවිධානමය කටයුතු සිදු කරන ලද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුග්‍රහය හා මැදිහත් වීම යටතේ රජරට සේවය විසිනි. එ බැවින්, යම් සංවර්ධනාත්මක සන්නිවේදන ව්‍යාපෘතියකදී එකී ආයතනික අන්තර් සම්බන්ධතාව වඩා ත් වැදගත් වූ සාධනීය ලක්ෂණයක් වනු ඇත. දැන හෝ නො දැන මීට පෙර මෙම ක්‍රමවේදය භාවිත කරමින් දියත් කරන ලද බොහෝ මාධ්‍ය ව්‍යාපෘතීන් අතිශය සාර්ථක වී ඇති බව එයින් අවධාරණය වෙයි.

## නව - IMC අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ක්‍රමවේදය


මෙහි IMC යනුවෙන් අදහස් කරනුයේ ආයතන (Institute), මාධ්‍යය (Media) හා ප්‍රජාව (Communityත සංක්‍රමණය වෙන පණිවිඩයෙන් පශ්චාද් තත්ත්වයක් පිළිබඳ ඵලදායි සාධකයන් ) යි. මාධ්‍ය ක්‍රියාවලිය ත්, අදාළ ආයතන හා ප්‍රජාව ත් එක්කොට බැඳෙන අන්තර් සම්බන්ධතාවකින් තොර වූ ව්‍යාපෘතීන් බොහෝ විට අසාර්ථකත්වයෙහි ලා ගිණිය හැකි බව එයින් පෙනේ. එ වැනි සන්නිවේදන ව්‍යාපෘතීන් සරල ඒක පාර්ශවික ඒවා වෙයි. හුදෙක් මාධ්‍ය ආයතනයේ සිට ප්‍රජාව වෙ හමු නොවේ.

නමුත්, යථාර්ථවත් සංවර්ධන සන්නිවේදන ක්‍රියාවලියක් නම්, යම් මාධ්‍ය කාර්යයක් හා සම්බන්ධතා දක්විය යුතු ආයතන ගණනින් බොහෝ ය. ඒවා ස්වභාවයෙන් ම මාධ්‍යය හා අන්තර් සම්බන්ධතා පවත්වා ගත යුතු ය.





*මාධ්‍යය හා ප්‍රජාව අතර වන ඒකපාර්ශවීය සන්නිවේදනය*

ඒ අනුව, යම් සන්නිවේදන මාධ්‍යයක්, වෙසෙසින් ගුවන්විදුලිය බඳු සංවර්ධන මාධ්‍යයක් එකී සාධනීයතාව ප්‍රකට කළ යුතු ව ඇත. පහත දක්වෙන්නේ ගුවන්විදුලිය මාධ්‍යය සිය අන්තර් සම්බන්ධතා ගොඩනගා ගතයුතු ආයතනික ස්වරූපය පිළිබඳ සංකේතාත්මක වූ රූපික ආකෘතිය කි.




*මාධ්‍ය හා ආයතනික සම්බන්ධතා*

උක්ත අන්තර් සම්බන්ධතාව යටතේ සිදුවන සංවර්ධන සන්නිවේදන ක්‍රියාවලිය පහත රූප සටහනින් පෙන්නුම් කෙරේ.




*නව - IMC අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ආකෘතිය*

මාධ්‍ය ක්‍රියාවලිය ත්, අදාළ ආයතනය ත් වඩා ත් දෘඪතර ලෙස ගොඩනගා ගත් අන්තර් සම්බන්ධතාවෙන් පැහැදිලි කරනුයේ ප්‍රචාරය කරන ලද වැඩසටහන හෝ ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් අවධානයක් එකී බහුවිධ පාර්ශ්වයන් තුළ පවත්නා බව යි.

ඒ අනුව, ශ්‍රාවක ජනතාව තුළ ද ඒ පිළිබඳ අත්‍යවශ්‍ය විශ්වසනීයත්වයක් ගොඩනැගෙනු ඇත. ඒ, රාජ්‍ය හෝ පෞද්ගලික අධිකාරීත්වය යටතේ ඒ සඳහා වගකීම් සහිත ආයතනයක් පෙනී සිටින නිසාවෙනි. ඒ නිසා ම, ප්‍රචාරය කෙරෙන වැඩසටහනට අදාළ දත්ත රැස් කිරීම, උපදෙස් සැපයීම, දැනුම ප්‍රදානය, වැඩසටහන් සැලසුම් කිරීම, සංවිධානය, අධීක්ෂණය හා සෙසු අනුග්‍රාහකත්වය ද එකී ආයතනය මගින් සැපයෙනු ඇත. මෙහි අනුග්‍රාහකත්වය යනු හුදෙක් මූල්‍යමය අනුග්‍රහය ම පමණක් නොවේ. වැඩසටහන ප්‍රචාරයෙන් පසුව ප්‍රතිචාර පිරික්සුම, නිරීක්ෂණ වාර්තාකිරීම, පසු විමසුම් කාර්යයන් හා ඇගයුම් ද ඊට අදාළ වෙයි.

නිසි වැඩ සැලසුමක් හා ක්‍රියා පිළිවෙළක් මේ සඳහා භාවිත කළ යුතු ය. ඒ ඒ ආයතනයන්ට අදාළ පාලනාධිකාරීන් අතර ගොඩනැගෙන අන්‍යොන්‍ය අවබෝධය හා සුහදතාව මෙහි දී වඩා ත් ඉවහල් වෙයි. සමස්ත සංවර්ධනයේ අයිතිය සමස්ත සමාජයට හා සමස්ත පාලනාධිකාරියට ලැබෙන්නේ එවිට ය. එබඳු සංවර්ධන ක්‍රියාවලීන් බොහෝවිට අංග සම්පූර්ණ ය.

## නිගමනය

ඒ අනුව මුල් ක්‍රියාවලියට වඩා මෙයින් ප්‍රකට කෙරෙන දිගු කාලීන ඵලදායී තත්වයන් විවිධාකාරී වෙයි, එනම්,

i. ආයතනික අන්තර් සම්බන්ධතා අඛණ්ඩ ව පවත්වා ගැනීමේ පහසුවක් ගොඩනැගිය හැකිවීම.

ii. ප්‍රතිචාර පිරික්සුම් සහිත පසුවිමසුම් කාර්යය ක්‍රියාපිළිවෙළක් ලෙස දියත් කිරීමේ පහසුව.

iii. ඇගයුම් හා ප්‍රතිපෝෂණීය වර්ධනයන් අව්‍යාජ ව සිදු කිරීමේ පහසුව ඇතිවීම.

කරුණු මෙසේ හෙයින්, සංවර්ධනාත්මක සන්නිවේදනයේ නාමයෙන් මෙතෙක් කල් දියත් වෙමින් තිබූ ඇල් මැරුණු ගතානුගතික හුදෙකලා ක්‍රියාවලිය වෙනුවට ඵලදායී වූ ත්, කාර්යක්ෂම මෙන් ම සාමූහික වූ ත් ක්‍රියාවලියක් ගොඩනැගීම මේ තුළින් සිදු කළ හැකි ය. ඒ බැවින් අඛණ්ඩ අන්තර් ආයතනික සම්බන්ධතා ක්‍රමවේදය, ලාංකීය ගුවන්විදුලියේ සංවර්ධන සන්නිවේදන කාර්යාවලියෙහි ලා ඉක්මණින් සැලසුම් කළ යුත්ත කි.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය

*කරුණානායක, නන්දන (1990) හැටහය වසරක ගුවන්විදුලිය, ප්‍රථම මුද්‍රණය, මොරටුව, ජනමාධ්‍ය හා ජාතික ප්‍රතිපත්ති පර්යේෂණ කේන්ද්‍රය*

*කොළඹගේ, ඩී. එම්. (1990) ගුවන්විදුලි වංශය, එම්.ඩී.ගුණසේන මුද්‍රණයක්, කොළඹ, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව*

*ජයවීර, නෙවිල් ඩී. (1967) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා ප්‍රතිපත්ති ප්‍රකාශය*

*රාජපක්ෂ, සිරිල් (1981) රජරටසේවා වැඩසටහන් පර්යේෂණ වාර්තාව, (අධ්‍යක්ෂවරයා හා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකින් උපුටා ගැනුණකි) කොළඹ, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය*

*ලංකා ගුවන්විදුලි සඟරාව 1967 - 1969 අතර කාලය තුළ ප්‍රකාශිත කලාප කියවා බලන්න.*